# මහවැලියේ එළවළු තෙල් භෝග වැවීම

මහවැලි ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් අරමුණු 3 ක් වටා දියත් කරන ලද, ව්‍යාපාරයකි. ලංකාවේ විදුලි බලය හිඟකම සපුරා ලීම සඳහා මහවැලි ගඟේ ජලය විදුලි බලය නිපදවීම සඳහා ජලාශ ඇති කොට ඒවායේ ව්‍යාපෘතීන් මගින් ජල විදුලිය නිපදවීම එක අරමුණක විය. මේ අනුව, දැනට ලංකාවේ නිපැවන විදුලි බලයෙන් 40% ක් උත්පාදනය වන්නේ මහවැලිය තුළිණි. 2 වැනි අරමුණ වූයේ මේ රටේ රැකියා නියුක්තිය ඇති කිරීම, ඉඩම් නොමැති අයට ඉඩම් ලබා දීම වේ. ප්‍රධාන පරමාර්ථය වූයේ පිට රටට අත දිගු නොකර මෙරට වගා කළ හැකි භෝග වර්ග මහවැලි ජලයෙන් මහවැලි පොලවේ තුලනාත්මකව වර්ධනය කොට කෘෂිකර්ම සංවර්ධනයක් ඇති කිරීමය. එමගින් මෙරටින් එතෙර ඇදී යන රට කාසි ඉතුරු කර ගැනීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තුවේ. ලංකාවේ වී නිෂ්පාදනයෙන් 12% ක් පමණ හා මිරිස් නිෂ්පාදනයෙන් 53% ක් පමණ මහවැලි ප්‍රදේශ වලින් දැනට සැපයේ.

එළවළු තෙල් ද මහවැලි ප්‍රදේශ වලින් ලබා ගත හැකිය. එක් අතකින් කර්මාන්තවල ඉල්ලුම සඳහාත්, අනෙක් අතට පාරිභෝජනය සඳහාත් එළවළු තෙල් නිෂ්පාදනය කරනු ලබන අතර, වී නිවුඩු රට කජු, තල, සෝයා බෝංචි, ඉරිඟු, කොහොඹ, මී නිදර්ශන සේ සඳහන් කළ හැක. මහවැලි ව්‍යාපාරය තුළ මෙම කර්මාන්තය වාණිජමය මට්ටමකින් කරනු ලබන අතර, ඒවා දේශීය පරිභෝජනය සඳහා මෙන්ම ආනයනය සඳහා ද උපයෝගී කර ගැනේ. මී, කොහොඹ වැනි තෙල් භෝග වලට විශාල ප්‍රමාණයක ඉල්ලුමක් ඇතත් සැපයුමක් ඒ තරම් නැති බැවින් දියුණුවක් ඇති වී නැත. මී වගාව සහ කොහොඹ වගාව ක්‍රමවත්ව වගාකර නිසි ලෙස එකතු කර ගන්නේ නම්, මාජරින්, සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය ලෙස උපයෝගී කර ගත හැකිය.

වාණිජ මට්ටමේ දියුණුවක් ලබා ගැනීම ඉතා අසීරුවේ. මහවැලිය මේ ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රතිපත්තිමය අතින් තවත් උපක්‍රමයක් යොදා ඇත. අතිම්, රැකියා ආයෝජන හා ව්‍යවසායන අංශය විසින් මෙරටේ එළවළු තෙල් ඇට වලට ඇති ඉල්ලුම සපුරාලනු වස් සමිති සටා ගම්වල පුද්ගලයන්ට වාණිජ මට්ටමින් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් බදු දීමේ ක්‍රමයක් ඇති කිරීමයි. දිස්ත්‍රික්ක මට්ටමින ක්‍රියාත්මක කිරීමට යම් සමාගමක් හෝ පුද්ගලයෙකු කැමති වන්නේ නම්, ඔහුට අවශ්‍ය මුදල් හා අවශ්‍ය ඉඩම් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ යෝග්‍යතා වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු ලබා ගත හැකිය. 'බී' කලාපයේ සහ 'සී' කලාපයේ ඉඩම් මේ සඳහා ලබා ගැනීමට අවශ්‍ය නම්, ඒ සඳහා මහවැලි ආර්ථික ඒජන්සියේ ආයෝජන අංශයෙන් විමසිය හැකිය.

## රටකජු

මහවැලි එළවළු ඇට අතර රටකජු නිපදවීම ප්‍රධාන තැනක් ගනී. බකමූණ – අත්තනකඩවල සහ 'බී' කලාපය, 'ජී' කලාපය මහවැලියෙ රටකජු වගා කිරීම සඳහා ප්‍රචලිතය. රටකජු වගාව වැඩි වශයෙන් කෙරෙන්නේ යල් කන්න තුළය. මේ හැරුණු විට 'එච්' කලාපය, 'සී' කලාපය, 'බී' කලාපය හා උඩ වලවේ රට කජු වගාව ව්‍යාප්ත වී ඇත. රට කජු වගාව ව්‍යාප්ත වීමට හේතු කීපයක් ඇත. ඒවා නම්,

ඉඩම් වාරිමාර්ග සහ මහවැලි සංවර්ධන
අමාත්‍යාංශයේ
කෘෂිකාර්මික සැළසුම් අධ්‍යක්ෂ
**ආරිය අබේසිංහ**

1. මහවැලි ගොවීන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත් ක්‍රමයට රට කජු වගා කිරීමයි. ඒ නිසා ඔවුන්ට තම නිෂ්පාදන වලට හොඳ මිලක් ලැබේ.
2. රටකජු සඳහා සාධාරණයෙන් කිලෝ වකට රුපියල් 11/— සිට රුපියල් 15/— දක්වා වූ මුදලක් ගෙවනු ලැබේ. මෙම දේශීය වෙළඳපොලේ මිල වැඩි වන්නේ රටකජු සඳහා ඉල්ලුමක් තිබුන හොත් පමණි. රට කජු සත්ත්ව ආහාර සඳහා ද ගන්නා බැවින් එයට සාමාන්‍ය ඉල්ලුමක් ඇත.

රටකජු ආශ්‍රිතව මහවැලිය තුළ ඇරඹිය හැකි කර්මාන්ත අතර, රටකජු තෙල්, බටර් නිෂ්පාදනය ඒ මගින් ප්‍රධාන තැනක් ගනී. බකමූණ – දියබෙදුම – අත්තනකඩවල හා 'බී' කලාපය ආදී ප්‍රදේශ රටකජු තෙල් නිෂ්පාදනය දියුණු කල හැකිය. ඒ සඳහා අවශ්‍ය වන්නේ ව්‍යාපාර යෝග්‍ය වාර්තාවක් හා හොඳ වෙළඳ පොලක් හා අමු ද්‍රව්‍ය සාධාරණ මිලකට ලබා ගැනීමේ හැකියාවක ඇති කිරීමය. මේ රටේ රටකජු පිට රටට යැවීමට නම්, මේ රටේ නිෂ්පාදනය කරන බීජ වර්ග වැඩි දියුණු කළ යුතුය. යල කන්නයේ විශේෂයෙන් සරු වගාවක් වශයෙන් තල වගාව ව්‍යාප්ත වී ඇත. සුදු තල හා කලු තල වශයෙන් තල වර්ග දෙකක් තිබේ. ආනයනය සඳහා අවශ්‍ය වන්නේ සුදු තලය. නමුත් මෙහිදී බලපාන ප්‍රධාන ප්‍රශ්නය නම් සුදු තල බීජ හිඟ කමයි. තල වගාව වැඩි වශයෙන්ම කෙරෙන්නේ 'එච්', කලාපය, 'බී' කලාපය, 'සී' කලාපය යන ප්‍රදේශවලය. හොඳ වර්ගයේ බීජ ලබා දීමට හැකි නම්, මහවැලියේ, ගොවීන්ට කොන්ත්‍රාත් ක්‍රමයට මේ වගාව සාර්ථකව කළ හැක. මේ සඳහා ඔවුන්ට හොඳ බීජ අවශ්‍ය වේ

## අබ

එළවළු බෝග අතර, එළවළු තෙල් ඇට අතර වැඩි සැලකිල්ලක් තවම පෙනෙන්නට නැත. අබ තෙල් නිෂ්පාදනය ද කළ හැක. අද පවත්නා තත්ත්වය අනුව හොඳ වර්ගයේ අබ බීජ ලබා ගැනීම දුෂ්කරව ඇත. මේ කාර්යය වැඩි දියුණු කිරීම පිළිබඳව ඇති හැකියාව ගැන සොයා බලා, ඊට අවශ්‍ය පිළියම් යෙදීම ඉතා වැදගත්ය. අබ තෙල් නිපදවීමේ හැකියාව මේ රටේ ඇති නිසා එයින්, විදේශ විනිමය විශාල වශයෙන් උපයා ගත හැකිය. අබ තෙල් සඳහා මෙරටින් — පිට රටට ඇදී යන රට කාසි ද ඉතිරිකර ගත හැකිය

මේ රටේ දැනට නිෂ්පාදනය කරන ඉරිඟු වැඩි වශයෙන් පාරිභෝජනය සඳහා ද, ඉතිරි කොටස් සත්ත්ව ආහාරය සඳහා ලබා ගත හැකිය නමුත් පිටරටවල ඉරිඟු ඇට තෙල් නිපදවා ගනිති. මහ

වැලිය තුළ ව්‍යාප්ත කල හැකි මෙම එළවළු තෙල් නිෂ්පාදනය වැදගත් ස්ථානයක් ගනී. සූරියකාන්ත ඇට තෙල් නිෂ්පාදනය මහවැලි ප්‍රදේශයේ දියුණු කළ හැකි තවත්, කර්මාන්තයක් වශයෙන් සැලකිය හැකිය.

එළවළු තෙල් භෝග වගාව මහවැලිය තුළ වගා කිරීමට හා නිෂ්පාදනය කිරීමට ඇති අවශ්‍යතාවය ද රට තුළ ඇති අමු ද්‍රව්‍ය මගින් ගත හැකි අවස්ථා ද ගැන ද මෙහි දී සඳහන් කරන ලදී. වාණිජ මට්ටමින් හෝ ගොවි මහතුන් ලවා කොන්ත්‍රාත් ක්‍රමයට කැමති ඕනෑම ආයතනයකට අත දීමට මහවැලිය කැමැත්තෙන් සිටින බව සඳහන් කළ යුතුය. මහවැලියේ මූලික පරමාර්ථය ගොවීන්ගේ ආදායම් මට්ටම වැඩි කිරීමත්, ඔවුන්ගේ මහවැලි නිෂ්පාදන රට තුළ වැඩි, වැඩියෙන් පරිභෝජනයට ගැනීමත්ය. එය කල හැක්කේ උසස් මිලක් ලැබෙන භෝග වගා කිරීම සඳහා ඔවුන් දිරි ගැන්වීමෙනි. යම් ආයෝජකයකු හෝ සමාගමක් මහවැලි ප්‍රදේශයට පැමිණ ආයෝජනයකට කැමති නම්, දීර්ඝකාලීන බදු ක්‍රමයක් යටතේ ඉඩම ලබා දීමට මහවැලි අධිකාරිය සූදානමට සිටී.

□